# හික්කඩුව නගර සභාව

# 2026 වර්ෂයට සැපයුම්කරුවන්, සේවාවන් හා කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීම.

හික්කඩුව නගර සභාව සඳහා 2026 වර්ෂය වෙනුවෙන් පහත සඳහන් සැපයුම්/ සේවාවන්/ කොන්ත්‍රාත් සැපයීමට කැමැත්තක් දක්වන සැපයුම් කරුවන්ගෙන් ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

02. මෙහි පහත උප ලේඛනයේ සඳහන් සැපයුම්, සේවාවන් හා කොන්ත්‍රාත් සඳහා වෙන් වෙන් වශයෙන් තමන් විසින් පිළියෙල කරන ලද අයදුම්පත් අදාළ ලියාපදිංචි ගාස්තු ද සමග 2025.12.29 වන දින ප.ව.03.00 ට පෙර ලැබෙන සේ **"සභාපති, හික්කඩුව නගර සභාව, හික්කඩුව"** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවීම හෝ අතින් ගෙනැවිත් භාර දීම කළ යුතුය.

03.අයදුම්පත් එවන ලියුම් කවරයේ වම්පස ඉහළ කෙලවරේ **"2026 වර්ෂය සඳහා සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම"** යනුවෙන් සඳහන් කළ යුතුය. ඉල්ලුම් පත්‍රය සමග ලියාපදිංචි ගාස්තු වශයෙන් එක් එක් අයිතමය වෙනුවෙන් ඉදිරියේ දක්වා ඇති මුදල **"සභාපති, හික්කඩුව නගර සභාව"** යන නමට ලියන ලද චෙක් පතකින් හෝ රාජකාරී දිනයන්හී පෙ.ව. 08.30 - ප.ව.03.00 අතර කාලය තුල ආයතනය වෙත පැමිණ මුදල් අයකැමි වෙත මුදල් ගෙවීම මගින් ඉදිරිපත් කළ හැක.

04. වැඩි විස්තර සඳහා අපගේ www.hikkaduwa.uc.gov.lk වෙබ් අඩවිය ඔස්සේ සහ කාර්යාලයට පැමිණ හෝ දුරකථන අංක 091-2274443 / 091-2275114 අමතා ලබාගත හැක.

**උපලේඛනය**

| අනු අංකය | අවශ්‍ය සැපයුම් සේවාවන් | ලියාපදිංචි ගාස්තුව රු. |
|---|---|---|
| | **සැපයුම්** | |
| 1. | ලිපි ද්‍රව්‍ය, ටෝනර්, රිබන්, පෙන් ඩ්‍රයිව් | 1500.00 |
| 2. | කාර්යාලීය උපකරණ, ලී බඩු, වානේ භාණ්ඩ යන ආදිය. | 1500.00 |
| 3. | කාර්යාලීය විද්‍යුත් උපකරණ ( පරිගණක හා උපාංග, ඡායා පිටපත් යන්ත්‍ර, ඩුප්ලෝ ෆැක්ස් යන්ත්‍ර, වේලාව සටහන් කිරීමේ යන්ත්‍ර, ප්‍රොජෙක්ටර්, ශබ්ද විකාශන යන්ත්‍ර, ශ්‍රවණාගාර උපකරණ) | 1500.00 |
| 4. | විදුලි උපකරණ හා වීථි පහන් කට්ටල | 1500.00 |
| 5. | සියළුම වර්ග වල හියුම් පයිප්ප, කම්බි කණු ආදිය | 1500.00 |
| 6. | කර්මාන්ත අංශයට අයත් ද්‍රව්‍ය ( පස්, ගල්, වැලි, ගඩොල්, සිමෙන්ති, කම්බි, ඇට, පින්තාරු වර්ග හා හාඩ්වෙයා අයිතම) | 1500.00 |
| 7. | නාම පුවරු, දැන්වීම් පුවරු, රබර් සීල්, නිල හැඳුනුම්පත් සකස් කිරීම. | 1500.00 |
| 8. | මාර්ග අලුත්වැඩියා කටයුතු සඳහා අවශ්‍ය ද්‍රව්‍ය ( තාර, කෝලාස්, කොරි පස්, රතු පස් ආදිය) | 1500.00 |
| 9. | ටයර්, ටියුබ් හා බැටරි සැපයීම. | 1500.00 |
| 10. | වාහන අමතර කොටස් සැපයීම | 1500.00 |
| 11. | කාරයාලීය තිර රෙදි, නිල ඇඳුම් සැපයීම | 1500.00 |
| 12. | සෞඛ්‍ය උපකරණ (කොහු, ඉදල්, අත් ආවරණ, රසායනික ද්‍රව්‍ය, සබන්, බූට්ස් ආදිය) | 1500.00 |
| 13. | පුස්තකාල සඳහා පොත් සැපයීම | 1500.00 |
| 14. | පෙර පාසල් හා පොදු ළමා උද්‍යාන, ක්‍රීඩා උපකරණ හා ටෙන්ට්, මඩු පුටු හා වැල්ඩින් උපකරණ | 1500.00 |
| 15. | වායුසමීකරණ සපයා සවි කිරීම. | 1500.00 |

| | | |
|---|---|---|
| | **සේවාවන්** | |
| 16. | වාහන අලුත්වැඩියා කිරීම | 1500.00 |
| 17. | යන්ත්‍රෝපකරණ අලුත්වැඩියා කිරීම | 1500.00 |
| 18. | වාහන සේවා කිරීම | 1500.00 |
| 19. | මුද්‍රණ කටයුතු | 1500.00 |
| 20. | පරිගණක, ඡායාපිටපත්, ෆැක්ස්, ස්කෑන්, ඩුප්ලෝ, මල්ටිමීඩියා හා ශ්‍රව්‍ය දෘශ්‍ය උපකරණ අලුත්වැඩියා කිරීම | 1500.00 |
| 21. | මාර්ග තනන යන්ත්‍ර, බැකෝ, ස්කැවේටර්, ඩෝසර්, මෝටර් ග්‍රේඩර්, හා කොන්ක්‍රීට් මිශ්‍රණ ඇතුලු ඉදිකිරීම් සඳහා යන්ත්‍රසූත්‍ර සැපයීම | 1500.00 |
| 22. | ආහාර පාන සේවා සැපයීම | 1500.00 |
| 23. | ආදාහනාගාර පෝරණු සඳහා අවශ්‍ය ද්‍රව්‍ය, උපකරණ සැපයීම, නඩත්තුව හා සේවා කිරීම. | 1500.00 |
| 24. | වායුසමීකරණ යන්ත්‍ර අලුත්වැඩියාව හා නඩත්තු කටයුතු | 1500.00 |
| 25. | ආරක්ෂිත කැමරා සවි කිරීම හා නඩත්තුව | 1500.00 |
| 26. | පවිත්‍රතා සේවාවන් හා ආරක්ෂක සේවාවන් සැපයීම | 1500.00 |
| 27. | උත්සව අවස්තාවන් සඳහා උත්සව භාණ්ඩ සැපයීම ( ටෙන්ට්, පුටු, මේස, කෝඩි කණු, ශබ්ද විකාශණ යන්ත්‍ර, වේදිකා නිර්මාණය යනාදිය) | 1500.00 |
| 28. | උද්‍යාන අලංකාර සේවාවන් සැපයීම | 1500.00 |
| 29. | කාර්යාලීය සේවා සැපයීම (පරිගණක ජාලගත කිරීම, පරිගණක මෘදුකාංග සකස් කිරීම, වෙබ් අඩවි නිර්මාණය ) | 1500.00 |
| | **කොන්ත්‍රාත්** | |
| 30. | රු.මිලියන 10ක් දක්වා වූ වැඩ/ කොන්ත්‍රාත් සඳහා ප්‍රජා පාදක සංවිධාන හා කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීම. | 2500.00 |

**කොන්දේසි:**

01. භාණ්ඩ හා සේවා ලබා ගැනීමේදී සැපයුම්කරුවන්ට අමතරව බාහිර සැපයුම්කරුවන්ගෙන්ද මිල ගණන් කැඳවා අවශ්‍ය භාණ්ඩ හා සේවා ලබා ගැනීමේ අයිතිය සභාව සතු වේ.
02. අයදුම් පත් ඉදිරිපත් කිරීමේදී ව්‍යාපාර නාම ලියාපදිංචිය/ සමාගම් ලියාපදිංචි සහතිකයේ පිටපත් හා කොන්ත්‍රාත් කරුවකු ලෙස ලියාපදිංචි වීමට ඉදිරිපත් වන්නේ නම් අදාළ කොන්ත්‍රාත් සමාගම හෝ ප්‍රජා පාදක සංවිධානය **"CIDA "** ආයතනයේ ලියාපදිංචි වී ඇති විස්තර හා ලියාපදිංචි සහතිකයේ ඡායා පිටපතක් අමුණා එවිය යුතුය.
03. අදාළ සැපයුම් හා සේවාවන් සඳහා වන සැපයුම්කරුවන් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව යටතේ එකතු කළ අගය මත බදු (VAT බදු) සඳහා ලියාපදිංචි වී ඇත්නම් එම සහතිකයේ පිටපතක්ද ඉදිරිපත් කළ යුතුය.

සභාපති
ප්‍රසම්පාදන කමිටුව
හික්කඩුව නගර සභාව